(හයවැනි පාර්ලිමේන්තුව —තෙවැනි සභාවාරය)

අංක. 3]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2008 ජූනි මස 17 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0001/'08

1.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) නිවාස සඳහා දී ඇති ද්‍රව්‍ය හා මුදල් හෝ සහනාධාර සඳහා එක් එක් අයිතමයක් වෙනුවෙන් රජය වියදම් කළ ප්‍රමාණය කොපමණද;

(ii) එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න පසුගිය වසර විස්සක කාලයට අදාළව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එවැනි සහනාධාර දැරීමට අප රටට හැකියාවක් තිබේද;

(ii) මෙම සහනාධාර වලින් ප්‍රතිලාභ ලබන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද හා එයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0002/'08

2.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) අද වන විට ඇති ව්‍යවස්ථාපිත මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

(ii) ක්‍රියාත්මකව පවතින වාණිජ සංස්ථා සංඛ්‍යාව කොපමණද;

(iii) ආරම්භයේදී වෙන් කරන ලද ප්‍රාග්ධනය සහ අද වන විට ඇති ශුද්ධ දේපල වටිනාකම කොපමණද; සහ

(iv) රජයට අයත් පූර්ණ අයිතිය ඇති සමාගම් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජයට කොටස් තිබෙන උප වෙළෙඳ සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) කොටස්වල ප්‍රතිශතය සහ වාර්ෂික පදනමින් පසුගිය අවුරුදු 3 තුළ ලාභය කොපමණද;

(iii) ලාභාංශ ගෙවා තිබේද;

(iv) එසේ නම්, ලැබූ මුදල් ප්‍රමාණය කොපමණද;

(v) පෞද්ගලීකරණය කරන ලද ප්‍රතිශතයක් ද සමග වාර්ෂික පදනමින් පසුගිය වසර 10 තුළ පෞද්ගලීකරණය කරන ලද රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(vi) රජයට කොටස් අයත් පෞද්ගලීකරණය කරන ලද ආයතනවලින් ලැබූ ලාභාංශ කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත (අ) කොටසේ (i), (ii), (iii) හා (iv) ට අදාළව යෙදවූ ප්‍රාග්ධනය, රැකියා සංඛ්‍යාව සහ බදුවලට පෙර සහ පසු ලාභය සහ බදු තනි තනිව සහ සාමූහිකව කොපමණදැයි එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0003/'08

3.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වසර දහයක කාලය තුළදී,—

(i) තීරු බදු, බදු, එකතු කළ අගය මත බදු, භාණ්ඩ හා සේවා බදු, නිෂ්පාදන බදු, ගුවන් තොටුපල සහ වරාය ගාස්තු, මුද්දර බදු, ව්‍යාපාරික පිරිවැටුම් බදු සහ වෙනත් බදු යන අයුරින් රජය විසින් උපයා ගන්නා ලද බදු ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත අගයන්, අයවැය මගින් අපේක්ෂිත ආදායම් සමග සංසන්දනාත්මකව පවතින්නේ කෙසේද සහ එම අගයන් දළ ජාතික නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) එක් එක් වර්ෂයේ උද්ධමන අනුපාතිකය කවරේද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) පෙර වර්ෂයේ උද්ධමන අනුපාතිකය හා සංසන්දනය කරමින් සහ පසුව එළඹෙන වර්ෂය සඳහා මුදලේ අගය අඩුකරමින් මුදලේ නියම අගය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0127/'08

4.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1979 අංක 63 දරන පළාත් පාලන නිවාස (සංශෝධන) පනත යටතේ, බස්නාහිර පළාතේ ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) ප්‍රදේශ අනුව නිවාස යෝජනාක්‍රම සංඛ්‍යාව වෙන් වෙන්ව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) වසර 20ට වැඩි කුලී පදනම මත ඇති නිවාස ඒ ඒ පළාත් පාලන ආයතනය විසින්, දේපළ බැහැර කිරීමේ සාධන පත්‍රයක් මගින් අයකිරීමක් නොමැතිව පවරා දෙන්නේද; සහ

(ii) එයට බාධාවක් ඇත්නම් එය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0128/'08

5.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු ලේකම් ආරියරත්න හේවගේ මහතා එම ධූරයට පත්වූ දින සිට සහභාගී වී තිබෙන විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එලෙස සංචාරය කළ රටවල් කවරේද;

(iii) එම ලේකම්වරයා ශ්‍රී ලංකාවෙන් පිටත් වූ දිනයන් සහ එම රටවල ගතකළ කාලය කොපමණද;

(iv) ඒ කවර කටයුත්තක් සඳහාද;

(v) එම සංචාරවලින් රටට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අදාළ ලේකම්වරයා සමඟ එම සංචාර සඳහා සහභාගී වූ අනෙකුත් අය කවුරුන්ද;

(ii) ඔවුන්ගේ තනතුරු කවරේද;

(iii) එම එක් එක් සංචාරය සඳහා වැයවී ඇති මුදල කොපමණද;

(iv) ඒ කවර වැය ශීර්ෂ යටතේද;

(v) මේ වන විට විදේශ සංචාර සඳහා වැය කර ඇති මුළු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0129/'08

6\.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වේරහැර වෙස්කෝ සමාගමේ සේවය කොට සේවය අහිමි වූ, කලින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (ශ්‍රී ලංගම) සේවය කළ සේවකයින් 400 ට ආසන්න පිරිසකට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේම සේවා ස්ථානවලට නැවත පත්වීම් ලබාදී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) අනියම් පදනම මත 2004. 08. 06 දින සේවයට බඳවාගත් මෙම සේවකයින් ස්ථිරකර නොමැති බවත්;

(ii) අර්ථසාධක අරමුදල් ගිණුමට මෙම සේවකයින්ගේ වැටුපෙන් මුදල් අයකර ගත්ත ද, අර්ථසාධක අරමුදල් අංකයක් ලබාදී නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) කලින් ශ්‍රී ලංගම සේවය කර තිබිය දී ඔවුනට අහිමිකළ සේවය වෙනුවෙන් ගෙවා ඇති මුදල, ඔවුනට ප්‍රමාණවත් වන්දියක් ලෙස සලකන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) එම මුදල ප්‍රමාණවත් නොවේ නම්, අදාළ සේවකයින්ට සිදු වූ අසාධාරණය වෙනුවෙන් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0183/'08

7\.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහවැලි "එච්" කලාපයේ තඹුත්තේගම හා ගල්නෑව නගරවල කොපමණ වාණිජ ඉඩම් කට්ටි ප්‍රමාණයක් ජනතාවට ලබාදී තිබේද; සහ

(ii) මෙසේ වාණිජ ඉඩම් ලබාදී තිබේනම්, කවර වර්ෂයක කවර පදනමකින් ඒවා ලබාදී තිබේද;

(iii) මෙසේ ලබාදී ඇති ඉඩම්වලින් කොපමණ සංඛ්‍යාවකට ජයභූමි, ස්වර්ණ භූමි හෝ කවර හෝ පදනමකින් ඉඩම් ඔප්පු ලබාදී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ ඔප්පු ලබා දී ඇති අයගේ නම් හා ලිපිනයන් කවරේද;

(ii) මෙම නගර දෙකේ ඉඩම් ඔප්පු ලබාදීමට කොපමණ සංඛ්‍යාවක් සිටින්නේද;

(iii) එසේ ඉඩම් ඔප්පු ලබාදීමට නියමිත අයගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) මෙම වාණිජ ඉඩම් ඔප්පු ලබාදීමට කවර ක්‍රියාමාර්ගයක් අනුගමනය කරන්නේද;

(ii) ව්‍යාපාර කටයුතු කරගෙන යාමේදී ව්‍යාපාර වැඩි දියුණු කරගැනීමට නොහැකිව අපහසුතාවයට පත්ව ඇති ව්‍යාපාරිකයින් සඳහා කඩිනමින් ඔප්පු ලබාදීමට අවශ්‍ය කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0184/'08

8.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා බැංකුව මගින් වර්ෂ 1996 සිට 2006 දක්වා ණය ගැනුම්කරුවන්ට මිලියන 1ට වඩා ලබා දී ඇති ණය මුදල්වල එකතුව ඒ ඒ වර්ෂය තුළ කොපමණද;

(ii) එසේ ලබාදී ඇති ණය වලින් පොලියත් සමග කොපමණ මුදලක් ඒ ඒ වර්ෂය තුළ අය කරගෙන තිබේද;

(iii) කොපමණ ප්‍රමාණයක් ඒ ඒ වර්ෂය තුළ අය කරගත නොහැකි ණය ලෙස සලකා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එසේ අය කරගැනීමට නොහැකි ණය ගැණුම්කරුවන්ගේ සහ ආයතනවල නම්, ලිපිනයන් සහ ලබාගෙන ඇති ණය ප්‍රමාණය කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙසේ ලබා දී ඇති ණය මුදල් වලින් කොපමණ ණය ප්‍රමාණයක් බොල් ණය සේ සලකා කපා හැර තිබේද; සහ

(ii) එසේ කපා හැර තිබේනම්, ණය කපා හල ආයතනවල හෝ පුද්ගලයින්ගේ නම්, ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) මෙසේ බොල් ණය ලෙස සලකා අයකරගැනීමට නොහැකිව ඇති ණය අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0185/'08

9.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පශු සම්පත් සම්මාන උළෙල නමින් උත්සවයක් පැවැත් වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම උත්සවය පැවැත් වූ ස්ථානය හා එම ස්ථානය වෙනුවෙන් වැයකළ මුදල කොපමණද;

(ii) එම උත්සවයේ ප්‍රචාරක වියදම් සඳහා වෙන්කළ මුදල සහ වැයකළ මුදල කොපමණද;

(iii) පෝස්ටර් සඳහා වැයකළ මුදල සහ විද්‍යුත් මාධ්‍ය හෝ පුවත්පත් දැන්වීම් පළ කළේ නම්, ඒ සඳහා වැයකළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වෙනත් ප්‍රචාරක උපක්‍රම භාවිත කළේ නම්, ඒ සඳහා වැයකළ මුදල වෙන් වෙන්ව කොපමණද;

(v) ප්‍රචාරක වියදම් ද ඇතුළුව උත්සවය සඳහා වැයකළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අදාළ උත්සවය සඳහා අමාත්‍යාංශයේ මුදල් වැයකළේද;

(ii) එසේ නම්, ඒ කවර වැයශීර්ෂයකින්ද;

(iii) අදාළ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, මණ්ඩල, සංස්ථා ආදියෙන් මුදල් ලබා ගත්තේද;

(iv) එසේ නම්, වෙන් වෙන් වශයෙන් ඒ කොපමණ මුදලක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0311/'08

10.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) රත්නපුර ප්‍රාදේශීය සභාවේ සභාපති, බන්දුල කරවිට මහතා විසින් ඔහුගේ බල ප්‍රදේශය තුළ පිහිටි "දෙහෙනැල්ල" නම් දිය ඇල්ල මැදිකොට කර ඇති පාරිසරික විනාශය හා පොදු දේපළ හානිය පිළිබඳව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපාරය සඳහා සබරගමුව පළාත් සභාවේ විදුලිබල හා පළාත් මාර්ග, පරිසර, සංචාරක, වෙළෙඳ අමාත්‍යාංශය මගින්, එහි ලේකම් ජේ. ඒ. රංජිත් මහතා විසින් 2006. 11. 09 වැනි දින රත්නපුර ප්‍රාදේශීය සභාවට රුපියල් 4,25,195/- ක මුදලක් ලබාදී ඇති බවත්;

(ii) ඒ සඳහා අදාළ සභාපතිගේ අත්සන හා දිනයක්, රහිතව ව්‍යාජ ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කර ඇති බවත්;

(iii) මෙම ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ නෛතික අනුග්‍රහය ලබා නැති බවත්;

(iv) මෙම "දෙහෙනැල්ල" ආශ්‍රිත ව්‍යාපෘතිය සභාවේ නිල කටයුත්තක් නොව සභාපතිගේ නිලය හා සභාවේ බලය යොදා, පළාත් සභාව නොමඟ යවා මුදල් ලබාගෙන කරන ලද පෞද්ගලික ක්‍රියාවක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) පොදු මහජන මුදල් වංචනික ලෙස භාවිත කිරීම පිළිබඳව සභාපතිවරයාට, එරෙහිව නීතිමය පියවර ගැනීමට එතුමා අවශ්‍ය කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0313/'08

11\.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයට අයත් සැලසිනේ රූපවාහිනී ආයතනයේ 2004 දෙසැම්බර් මාසය වන විට සේවය කළ සේවකයින් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004 දෙසැම්බර් සිට 2007 ජුනි මස දක්වා බඳවා ගෙන ඇති සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට සිටින සම්පූර්ණ සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ගේ තනතුරු, නම්, බඳවා ගත් දිනය සහ ලබන වැටුප වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2004 දෙසැම්බර් මාසයෙන් පසුව බඳවාගෙන ඇති සේවක පිරිස්, කිසියම් පෞද්ගලික ව්‍යාපාරයක සේවය කරමින් සිටියදී සැලසිනේ ආයතනයට බඳවා ගනු ලැබුවේද;

(ii) එසේ නම්, එම පෞද්ගලික ආයතනයේ නම කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) එම පෞද්ගලික ආයතනයේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින අය කවුරුන්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— තේරීම් කාරක සභාව,— 2008.06.06 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාර, මෙම කාරක සභාවේ සභාපති වන ගරු කථානායකතුමාට අතිරේකව, පහත සඳහන් මන්ත්‍රීවරුන් විසිතුන් දෙනා (23) පවත්නා සැසිවාරය තුළ දී තේරීම් කාරක සභාවේ සේවය කළ යුතුය.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු ෆේරියල් ඉස්මයිල් අෂ්රොෆ් මහත්මිය

ගරු කරු ජයසූරිය මහතා
ගරු පී. චන්ද්‍රසේකරන් මහතා
ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
ගරු ඩිව් ගුණසේකර මහතා
ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
ගරු රවි කරුණානායක මහතා
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
ගරු රංජිත් අලුවිහාරේ මහතා
ගරු අනුර දිසානායක මහතා
ගරු විජිත හේරත් මහතා
ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා
ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා
ගරු මොහොමඩ් ෂෆීක් රාජබ්දීන් මහතා
ගරු පයිසල් කාසිම් මහතා
ගරු මංගල සමරවීර මහතා

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම,— අද දින විසිර යාමේ දී මෙම පාර්ලිමේන්තුව 2008 ජුනි මස 19 වැනි බ්‍රහස්පතින්දා පූ.භා.9.30 වන තෙක් කල් තැබිය යුතුය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*9.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*10.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*11.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*12.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.) [1]

*13.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2008 ජනවාරි මස 09 වැනි දින 1531/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.03.04 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*15.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,—යුද හමුදා පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු (357 වැනි අධිකාරය වූ) යුද හමුදා පනතේ 155 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සාදනු ලැබ, අංක 1543/18 දරන 2008 අප්‍රේල් 01 වැනි දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.05.06 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*16.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 වැනි දින අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද " 2008 අංක 01 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ( තේ කර්මාන්ත ශාලා ඉදි කිරිම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග" අනුමත කළ යුතු ය.

*17.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වන වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 වැනි දින අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*18.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වන) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යවරයා විසින් මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 වැනි දින අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතුය.

*19.

නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමා,— නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 21 වැනි වගන්තිය යටතේ, නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 පෙබරවාරි මස 27 වැනි දිනැති අංක 1538/24 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.05.06 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*20.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— කොන්සියුලර් කර්තව්‍ය පනත යටතේ නිවේදනය,— 1981 අංක 4 දරන කොන්සියුලර් කර්තව්‍ය පනතේ 8 වැනි වගන්තිය යටතේ කොන්සියුලර් සේවා සඳහා අය කරනු ලබන ගාස්තු සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2007 ජූනි මස 11 වැනි දින හා අංක 1501/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008. 02. 05 වැනි දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

*21.

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා,—පරිපූරක මුදල — ශීර්ෂය 160,— වැඩසටහන 02,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළහැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් දහඅට කෝටි අසූ ලක්ෂයකට (රු.188,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | |
|---|---|---|
| ශීර්ෂය 160 — | පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය | |
| වැඩ සටහන 02 — | සංවර්ධන ක්‍රියාකාරකම් | |
| ව්‍යාපෘතිය 3(24) — | වන සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය | |
| | පුනරාවර්තන වියදම් | රු. — |
| | මූලධන වියදම් | රු. 188,000,000 |
| | මුළු වියදම | රු. 188,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

†2008 ජූනි මස 05 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 01 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

*22.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා ,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 26 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 26 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය වන, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 25002 " වෙනත් ආණ්ඩු වෙනුවෙන් ගෙවීම් සඳහා වූ අත්තිකාරම් ගිණුම" රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව දරන කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 53,00,000 සිට රු. 49,00,000 දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය,

2008.02.22 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*23.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා ,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 35 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 35 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය වන, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 31003 " රජයේ කර්මාන්ත ශාලාවේ කළ වැඩ අත්තිකාරම් ගිණුම" රජයේ කර්මාන්ත ශාලාව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 140,000,000 සිට<br>රු. 275,000,000 දක්වා |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය,

2008.04.21 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා ,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 3),— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 36 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය

## යටතේ අංක 36 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය වන, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 31002 " රජයේ කර්මාන්ත ශාලාවේ ගබඩා අත්තිකාරම් ගිණුම" රජයේ කර්මාන්ත ශාලාව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 4,50,00,000<br>රු. 13,50,00,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත | |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය,

2008.04.21 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*25.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා ,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 4),— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 38 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය

## යටතේ අංක 38 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය වන, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 01602 "අල්ලස් හෝ දූෂණ චෝදනා කොමිසම — අල්ලස් වැටලීම් අත්තිකාරම් ගිණුම " දරන කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 30,00,000<br>රු. 65,00,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 8,00,000<br>රු. 20,00,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |

| | | |
|---|---|---|
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය,

2008.04.30 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*26.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා ,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 5),— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 13 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 13 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය වන, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 23202 “බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්මික හා කෘෂිකාර්මික කටයුතු පිළිබඳ අත්තිකාරම් ගිණුම” බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 6,50,00,000 සිට<br>රු. 7,50,00,000 දක්වා |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 6,60,00,000 සිට<br>රු. 7,60,00,000 දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 3,00,00,000 සිට<br>රු. 3,10,00,000 දක්වා |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය,

2008.05.05 වැනි දින,

කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*27.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා ,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 6),— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 39 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය

## යටතේ අංක 39 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවන, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය " අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 1,30,00,00,000<br>රු. 2,39,84,00,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,30,00,00,000<br>රු. 2,26,40,00,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 60,00,00,000<br>රු. 80,00,00,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 15,00,00,000<br>රු. 1,49,00,00,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය,

2008.05.16 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*28.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවනු ලබන මාසික දීමනාව සිය නිත්‍ය තනතුරේ මාසික වැටුපෙන් 1/3 කට සමාන මාසික දීමනාවක් විය යුතු යැයි ද, එය 2007 ජනවාරි මස 01 වැනි දින සිට ගෙවිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට, මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනාව ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*29.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2002.01.28 වැනි දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දාහත්වැනි සංශෝධනයේ 27(2) වගන්තිය යටතේ 2002.01.29 වැනි දින සිට නැවත එම ධුරයට පත් කරන ලදුව, ඉන් අනතුරුව රාජ්‍ය සේවයේ කරන ලද වැටුප් සංශෝධනවලට අනුව මැතිවරණ කොමසාරිස්වරයාගේ වැටුප් 2006.11.23 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද නමුත් ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාව යටතේ මෙම ධුරයට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් එම අවස්ථාවේ නිශ්චය නොකරන ලද හෙයින් මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා නැවත එම ධුරයට පත් කළ 2002.01.29 වැනි දින සිට ධුරය දරන තාක් කාලයට හිමි වැටුප් වර්ධක අගයන් ද වැටුපට එකතු කොට වැටුප් ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*30.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ පාරිශ්‍රමිකය හා දීමනාව, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද පාරිශ්‍රමිකයෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද පාරිශ්‍රමික හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*31.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| දීමනාව | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| දීමනාව | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද දීමනාවෙන් (ඉන්ධන දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ දීමනාව 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*32.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) ඡේදය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 66,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 80,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනා | - | රු. | 12,000.00 | මාසික |
| | එකතුව | රු. | 77,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනාව සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*33.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගේ නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*34.

ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ වාර්ෂික වාර්තාව 2004,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2006. 07. 21 වන දින ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2004 වර්ෂයේ වාර්ෂික වාර්තාව, අවසාන ගිණුම සහ විගණකාධිපතිගේ වාර්තාව අනුමත කළ යුතු ය.

(නිවාස සහ ඉදිකිරීම් පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී)

*35.

ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා,— ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව 2005,— 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය යටතේ 2006.11.24 වන දින ඉදිරිපත් කරන ලද ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ 2005 වර්ෂයේ වාර්ෂික වාර්තාව, අවසාන ගිණුම සහ විගණකාධිපතිගේ වාර්තාව අනුමත කළ යුතු ය.

(ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී)

36.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

37.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

38.

මහවැලි සංස්කෘතික පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

39.

රංගා කලායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

40.

සංස්කෘතිය සහ සංවර්ධනය සඳහා වූ මුස්ලිම් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]

“ පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය” යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0302/’08

1\.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2004 සිට මේ දක්වා දිවයිනේ සියලුම පළාත් සභාවල එක් එක් ආයතනය යටතේ බඳවා ගෙන ඇති ස්ථිර/ කොන්ත්‍රාත්/ අනියම්/ තාවකාලික සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) එක් එක් ආයතනය යටතේ බඳවාගෙන ඇති සේවකයින්ගේ නම් හා ලිපිනයන්, ඔවුන්ගේ තොරතුරු, අධ්‍යාපන සුදුසුකම්, බඳවා ගැනීමේ පදනම හා ඔවුන් ලබන වැටුප්ද විස්තර සහිතව එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?